රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 21/2006(III)

මගේ අංකය :- ආ/4/3/1/14-1
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2008.04.07

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක කොන්ත්‍රාත් සහ සහන පදනම මත**
**<u>බඳවාගත් සේවකයන් ස්ථිර කිරීම</u>**

2006.12.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එහි පළමුවන ඡේදය හා එම ඡේදයේ ii හා iv උප වගන්ති පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

(අ) 1 ඡේදය -
2006.12.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2006 හි පළමු ඡේදයේ සඳහන් සේවයේ ස්ථිර කිරීමට රජය තීරණය කර ඇති 2006.11.01 දිනය 2007.07.01වශයෙන් සංශෝධනය කිරීම.

(ආ) ii උප වගන්තිය -
අනුමත සේවක සංඛ්‍යාවට අයත් දනට පුරප්පාඩුව පවත්නා ස්ථිර තනතුරේ සතුටුදයක ලෙස සහ අඛණ්ඩව (වැඩ කරන) දින 180 සපුරාලිය යුතු දිනය, "2007.06.30 දිනට" වශයෙන් සංශෝධනය කිරීම.

(ඇ) iv උප වගන්තිය -
"2002.10.01සහ 2002.10.24 දිනැති කළමණාකරන සේවා චක්‍රලේඛ 16 හා 16(1) නිකුත් කිරීමෙන් පසුව ඉහත පදනම මත කරන ලද පත්කිරීමක් නම් ඒ සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියක් ලැබී තිබීම සහ අනුමැතිය ලබාගතයුතු වෙනත් බලධාරීන් වේ නම්, එකී අනුමැතිය ලබාගෙන තිබිය යුතුය" වශයෙන්ද සංශෝධනය කිරීම.

02. 2007.07.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2006(1) හා 2007.11.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2006(11) හි විධිවිධාන තවදුරටත් නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

03. තවද මින් ඉදිරියට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු සඳහා පත්කිරීම් කිරීමේදී සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් අදාල සේවා ව්‍යවස්ථාවල සහ බඳවාගැනීමේ පරිපාටිවල දක්වා ඇති විධිවිධාන එලෙසම අනුගමනය කලයුතු බවද අවධාරණය කරනු ලැබේ.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය